

ඇයිද එහෙම වන්නේ?
වී.එන්.අර්ලෝෆ්

## සීත කාලයේදී වලස් පැංචා නිදාගන්නේ ඇයි ?

"වලස් හාමි, වලස් හාමි, මොකදෑ අසනීපයක්ද ?
සීත කාලෙ ඇයි මේ හැටි නිදාගන්නෙ අගුණයක්ද ?"

"නොපෙනෙන්නෙද හැම තැන සුදු
හිම වැටිලා සේ වතුසුදු
මී පැණි නැත - නැත පලතුරු
නිදා ගනිමි හිරු එනතුරු"






## කුකුළු රාළ කරමලය හොවාගෙන යනුයේ කොහිද ?

"කුකුළු රාළ, ඇයි නුඹ මේ
කරමලයක් හිස් මුදුනේ
යන යන තැන ගෙන යන්නේ ?"
ඌරු පැංච විමසන්නේ

පැනයට පිළිතුරු දෙන්නේ
කුකුළු රාළ පවසන්නේ
"සාක්කුවක් මගෙ කමිසේ
මසා නැතේ පිහිට හිසේ"



ඉබි කටුවේ කොටු ලකුණු
සටහන්ව ඇත්තේ ඇයි ?
"ඉබ්බන් අඳිනා පිටකටු කමිසේ
කොටු ගහලා ඇත කිම මේ අරුමේ ?"
"විනෝදයෙන් කාලය ගෙවනා විට
ඉබි පැටවුන්හට දාම් අදින්නට"



## බලු රාළ වලිගය වනන්නේ ඇයි ?

"නපුරු බලු රාළේ" - වලිගය වැනූ වේලේ
"මේ කිමදැයි බොලේ" - කියා පිළිවිස්සෝය කුහුලේ

"වලිගය වනන්නේ - පුහුණුව ලද නිසානේ"
"නැත එහෙම වන්නේ - අඹරලා නැත නියම ලෙසිනේ"

## ගොළු බෙල්ලන් නිවසින් පිටට නොයෙන්නේ ඇයි ?

"ගොළු බෙලි රාළේ, ගොළු බෙලි රාළේ
ඇයි ඔය ගෙදරින් පිටට නොයෙන්නේ ?"

"අපේ ගෙදර දොර කවුළු නොමැත්තේ
ඉතින් කෙලෙස එළියට බැසගන්නේ ?"



## සඳේ මුහුදුවල වතුර නැත්තේ ඇයි ?


සඳ මතුපිට මහ සාගර ඇත්තේ
එනමුදු එහි දිය බිඳකුදු නැත්තේ


සඳ මිනිසුන් හට සඳේ එකල සිටි
සොබාදහම ගැන නොතිබිණි ඇල්මක්
තමන්ගෙ බඩටම වාල්වෙලා උන්
සිතුවේ එළවළු කොටු ගැන පමණක්

# කිඹුල්හාමි කොළපාට ඇයි ?

"කිඹුල්හාමි මොකදෑ කොළපාටින්
ගිල දැමූවද ගෙඹි පැටවුන් සැබැවින් ?"

"ඇත්තම පවසන්නෙමි මම රහසින්
මාව ඉදෙන්නේ නැහැ නෙවැ විගහින්"






## කිරි බොන්න ඕනෑ ඇයි ?

"කිසිවකුටත් මා කටක් නොසෙල්වූ
රහසක් ඇත කීමට මට සිත්වූ


මව් කිරි අත්හැරි කාලේ සිට මට
වෙන කිසි කිරියක් බොනු බෑ පිරියට
එනමුදු හරකිට දුක් නොසිතෙන්නට
උගේ නැවුම් කිරි බොමි මම කදිමට"



## සූර්යකාන්ත මල් පහළ වූයේ කෙසේද ?

"මලේ, මලේ, සූර්යකාන්ත මහ මලේ
කොහේ, කොහේ සිට නුඹ ආවෙහිද, මලේ?"

"බලේ, බලේ මහ හිරු දෙයියන්නෙ බලේ
පසුම්බියෙන් ගෙන මෙහි ඉන්දුවා බොලේ"



## සරත් සමයේදී ගස්වල කොළ හැලෙන්නේ ඇයි ?


"සීත කාලෙ එන්නට පෙර
ඇයි ගස්වල කොළ හැලෙන්නෙ ?"

"ඇයි නින්දට යන්නට පෙර
දිවා ඇඳුම් උනාලන්නෙ ?"

## පතොක් ගහේ දිගට කටු ඇදෙන්නේ ඇයි ?

"පතොක් මල්ලි දැන් පිළිතුරු දෙන්නේ
ඇයි ඇඟ හැමතැන උල් කටු ඇත්තේ ?"


"කරණෑවෑමියා බයේ දුවනවා
ගින්නට වැඩියෙන් මට බයවෙනවා"



## කුඩා දරුවන් වැඩිහිටියන්ට කන්දිය යුත්තේ ඇයි ?

පුලුන් වගේ සුදු රැවුල දිගයි
අපෙ සීයට අවුරුදු සීයයි
"මොකක්ද සීයේ මෙච්චර කල්
ජීවත් වීමේ රහස කියන්"

"මෙහි ඇති රහසක් නැතේ බොලන්"
සීයා අපෙ කීවානෙ බලන්
"ඇසුවා කී දේ වැඩිහිටියන්
මා හොඳටම වයසට යනකම්"



# ඇයිද එහෙම වන්නේ?

## වී.එන්.අර්ලෝෆ්

චිත්‍ර
**ටී. චෙර්කාසවා**

අනුවාදය
**රන්ජන දේවමිත්‍ර සේනාසිංහ**

Kanol


**අගහස් ප්‍රකාශන**
717/2, මාදින්නාගොඩ, රාජගිරිය.
0112793671 | 0773985968
roma.lanka@mail.ru

ISBN 978-955-0230-18-1
Rs. 125/-
9"789550"230181"